

සම්මන්ත්‍රණ මාලාව

ඉංජිනේරු තාක්ෂණවේදය

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තුමේන්තුව | තාක්ෂණවේදය අංශය

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තුමේන්තුව
සම්මන්ත්‍රණ මාලාව අංක-02
ඉංජිනේරු තාක්ෂණවේදය

1)

A.

(i) ලී අල්මාරිය වෙනුවට ලෝහ අල්මාරිය භාවිතය බහුල වී ඇත. මේ සඳහා පාදක වූ තාක්ෂණික සාධකය බැගින් ලියන්න.

(a) ද්‍රව්‍ය තාක්ෂණවේදී සාධකය

(b) නිෂ්පාදන තාක්ෂණවේදී සාධකය

(ii) ලෝහ අල්මාරිය සෑදීමට භාවිතා කරන ලෝහය නම් , එම ලෝහය භාවිතා කිරීමේ එම ලෝහය භාවිතා කිරීමේ වාසි 02ක් ලියා දක්වන්න.

(iii) විදුලි පහන් වර්ග අතීතයේ සිට මේ දක්වා විකාශනය වී ඇති අයුරු සඳහන් කරන්න.

(iv) තාක්ෂණවේදි කළමනාකරණයේ අරමුණු කුමක් දැයි පැහැදිලි කරන්න.

(v) තාක්ෂණවේදි කළමනාකරණයේ දී සැලකිය යුතු කරුණක් ලියන්න.

B. එක්තරා මිනුම් උපකරණයක් භාවිතා කර ලබා ගත් මිනුමක් රූපයේ දක්වා ඇත.



(i) මෙම උපකරණය නම් කරන්න.
(ii) මෙම උපකරණයේ කුඩාම මිණුම සොයන්න.

(iii) ඉහත රූප සටහනේ පෙන්වන මිනුම ලියා දක්වන්න

(iv) මෙම මිනුම් පහත දැක්වෙන ඒකක වලට හරවා ලියන්න.

a. µm
b. m

C.

(i) මානව ගනික විද්‍යාව යනු කුමක් ද ?

(ii) ප්‍රමිතින්ට අනුකූලව වැඩ පරිසරයක් සකස් කරන ආකාරය උදාහරණ 02 ක් සඳහන් කර පෙන්වන්න.

(iii) ISO 1800 යන ප්‍රමිතියට අයත් රේගුලාසියක් සඳහන් කරන්න

D.

(i) පාසලේ යාන්ත්‍රික විද්‍යාගාරය තුළ සිසුන්ට සිදුවිය හැකි අනතුරු 03 ක් ලියන්න.

(ii) ප්‍රථමාධාර යන පදය හඳුන්වන්න

(iv) ප්‍රථමාධාර පෙට්ටියක තිබිය යුතු භාණ්ඩ 05 ක් සඳහන් කරන්න.

2)

A. රටක සංවර්ධනය කෙරෙහි නව නිපැයුම් (Inventions) සහ නව්‍යතා(Innovations) ඇසුරෙන් ජනිත වන ව්‍යාපාර අතිමහත් වූ දායකත්වයක් සපයයි. මෙමගින් රටක ආර්ථිකය සවිමත් විය. ස්වාභාවික වියළි මල් භාවිතා කර අලංකාර රාමු සකසා විකිණීමේ ව්‍යාපාරයක් ඇරඹීමට ඔබත් පෙළඹුහ.

(i) ව්‍යවසායකයා යනු කවරෙක් ද?

(ii) ව්‍යවසායකයකු වීමට ඔබ තුළ ලිබිය යුතු පෞද්ගලික ගති ලක්ෂණ 03 ක් සඳහන් කරන්න.

(iii) ඔබගේ ව්‍යවසායකත්ව හැකියාව පිළිබඳව අවබෝධයක් ලබා ගැනීමට පිරික්සුම් ලැයිස්තුවක් උපයෝගී කර ගත හැකිය. එම ලැයිස්තුවේ පහත සඳහන් තත්වයන්ට අයත් ලකුණු කුමක් දැයි ලියන්න.

a. ව්‍යවසායක ලක්ෂණ ඉහළින් පිහිටා ඇත.
b. ඉතා දුර්වල ව්‍යවසායක ලක්ෂණ පිහිටා ඇත

(iv) ව්‍යවසායකයකු වීමට උත්සහ දරණ ඔබ අවධානය යොමු කළ යුතු කරුණු 03 ක් සහන් කරන්න.

(v) රටක ව්‍යවසායකත්ව සංවර්ධනයට අවශ්‍ය කරන පසුබිම් සාධකයක් ලියන්න.

(vi) ඔබේ ව්‍යාපාරය ඇරඹීමේ දී හා අලෙවි උපක්‍රම සෙවීමේදී ව්‍යාපාරයට ඇති ශක්ති, දුර්වලතා , අවස්ථා හා තර්ජන පිළිබඳව එක් උදාහරණයක් මඟින් පහත වගුව සම්පූර්ණ කරන්න.

ශක්ති (Strengths)	
දුර් වලතා (Weaknesses)	
අවස්ථා (Opportunities)	
තර්ජන (Threats)	

(vii) ඔබ විසින් නිපදවනු භාණ්ඩ අ ලෙවි කිරීමට පාරිභෝගිකයන් පොලඹවා ගැනීමට ඔබ විසින් භාවිතා කරනු ලබන උපාය මා ර්ගයක් ප්‍රකාශ කරන්න.

B.

(i) ශේෂ පත්‍රයක ප්‍රධාන කොටස් ලියා දක්වන්න.

(ii) ඉහත සඳහන් කර කොටස්වලට උදාහරණයක් බැඟින් ලියන්න.

(iii) ශේෂ පත්‍ර යේ ඇති විශේෂත්වය කුමක්ද ?

C.

(i) ලාභ සමචිජේදන ලක්ෂය කෙටියෙන් හඳුන්වන්න.

(ii) ලාභ සමචිජේදනය පිළිබඳව සලකා බැලීම අවශ්‍යතාවන් 02 ක් ලියන්න.

(iii) ලාභ සමචිජේදනය ප්‍රස්තාරයක ඇඳ එය නම් කරන්න.

3)

A.

(i) ඉංජිනේරු තාක්ෂණවේදය යනු කුමක් ද?

(ii) නාෂ්ටික බලය සොයා ගැනීමෙන් ඇති වුනු යහපත් සහ අයහපත් බලපෑමක් බැඟින් ලියන්න

(iii) කාර්මික විප්ලවය පසුබිම තුළ ඇති වූ සිදුවීම් 03 ක් ලියා දක්වන්න.

(iv) ක්‍රි.ව. 2000 සිට මෙතෙක් කාල පරාසය කුමන යුගය ලෙස නම් කර තිබේ ද ?

(v) තාක්ෂණවේදයේ අනාගත ප්‍රවණතා 03 ක් සඳහන් කරන්න.

B.

(i) පහත සඳහන් මිනුම් ලබා ගැනීමට යෝග්‍ය උපකරණ නම් කරන්න
   a. කාර්ඩ් බෝඩ් ෆයිල් කවරයක ෂනකම -
   b. සේලයින් බටයක බාහිර විශ්කම්භය -
   c. ටැපට් පරතරය -

(ii) බහුමීටරය භාවිතා කර මනින ලද මිනුම් 03 ක් සඳහන් කරන්න.

(iii) සුක්ෂ්ම මිනුම් උපකරණ භාවිතයෙන් ඇතිවිය හැකි දෝෂ 02 ක් සඳහන් කර එම දෝෂ අවම කර ගැනීමේ ක්‍රමවේදයක් ද ලියන්න.

C.

(i) නිවසේ කොටසකට අලුතෙන් විදුලි සැපයුමක් ලබා ගැනීම පිණිස වැඩ ආරම්භයේදී කළ යුතු ආරක්ෂිත කාර්යයන් 02 ක් ලියන්න.

(ii) යොතක රැහැනක හෝ ලෝහ පෘෂ්ඨයක ප්‍රත්‍යාවර්ථ වෝල්ටීයතාව පවතීදැයි පරීක්ෂා කිරීම සඳහා භාවිතා කරන උපකරණ මොනවා ද ?

(iii) විදුලි සැර වැදීමක දී සිදුවිය හැකි අනතුරු 02 ක් සඳහන් කරන්න.

(iv) විදුලි කාර්මිකයන් විසින් පළඳින ලද ආරක්ෂිත ඇඳුම්වල නොතිබිය යුතු කරුණු 03 ක් ලියන්න.

(v) විදුලියෙන් ඇති වූ ගින්දර නිවීමට උචිත ගිනි නිවණක් නම් කර එය තුළ අඩංගු වී ඇති ද්‍රාවණ සඳහන් කරන්න.

4)

A. තාක්ෂණවේදය මිනිසාට හා පරිසරයට යහපත් බලපෑම් මෙන්ම අයහපත් බලපෑම්ද ඇති කරයි.

(i) තාක්ෂණික සංවර්ධනය නිසා මිනිසා කෙරෙහි ඇතිවන යහපත් හා අයහපත් බලපෑම් 2 බැගින් ලියා දක්වන්න.

(ii) තාක්ෂණය භාවිතයෙන් ඇතිවන පාරිසරික බලපෑමක් සඳහන් කර, එම බලපෑම නිසා මිනිසාගේ පැවැත්මට ඇතිවන හානි අවම කිරීම සඳහා ගන්නා වූ ක්‍රියාමාර්ග 2 ක් ලියන්න.

(iii) වීදුරු යනු අහඹු සොයාගැනීමකි. වීදුරුවල ඇති විශිෂ්ටත්වයන් 2 ක් සඳහන් කරන්න.

(iv) "නැනෝ" තාක්ෂණය යනු කුමක්ද?

B. විදුලි රැහැන් තුළ ඇති තඹ කම්බියක විෂ්කම්භය මැනීම සඳහා ඔබ සූදානම් වී ඇත.

(i) එම කාර්යය සඳහා ඔබ භාවිතා කිරීමට යෝජනා කර ඇති මිණුම් උපකරණය නම් කරන්න.

(ii) එම උපකරණය තෝරා ගැනීමට හේතු 02ක් සඳහන් කරන්න.

(iii) එම උපකරණය භාවිතා කරන විට අනුගමනය කළ යුතු අත්‍යාවශ්‍ය ක්‍රියාවලියන් 02ක් ලියා දක්වන්න.

(iv) ප්ලාස්ටික් පෑන් බටයක විෂ්කම්භය සොයා ගැනීමේ කාර්යයට ඉහත ඔබ තෝරාගත් මිනුම් උපකරණය භාවිතා කල හැකිද? ඔව්/නැත නම් එයට හේතු දක්වන්න.

C. යම් කාර්යයකදී ආරක්ෂාව පළමුවෙන්ම සැළකිය යුතු බැවින් ඒ පිළිබඳව ජාත්‍යන්තර ප්‍රමිතීන් සකස් කර ඇත.

(i) පහත කාරනාවන් පිළිබඳව සකස් කර ඇති ප්‍රමිතීන් නම් කරන්න.

- සෞඛ්‍ය හා ආරක්ෂාව
- කම්කරු ප්‍රමිතිය

(ii) ජාත්‍යන්තර ප්‍රමිතීන්වල වැදගත්කම විස්තර කරන්න.

D. ආපදා අවම කිරීමේ ක්‍රමවේදයක් ලෙස යම් කාර්යයක් සඳහා නිපුණතාවය ලබා ගැනීමේ අවශ්‍යතාවය මතුවිය.

(i) නිපුණතාවය ලබා ගැනීම සඳහා අවශ්‍යවන කරුණු 03ක් ලියන්න.
(ii) පරිපාලනමය කාර්යයක් මඟින් අනතුරු වැළැක්වීම සිදුකළ හැකි බවට උදාහරණ 02 ක් සඳහන් කරන්න.
(iii) පුද්ගල වර්ණ කේත ආරක්ෂිත උපකරණ කිහිපයක් පහත දී ඇත. මෙම උපකරණ භාවිතා කරන අවස්ථාවක් ලියා දක්වන්න

.

- ආරක්ෂිතඅත්වැසුම්
- ආරක්ෂිතසපත්තු
- ආරක්ෂිතහිස්ආවරණ
- ආරක්ෂිතඇඳුම්

(i) කර්මාන්ත ශාලාවලදී සිදුවන අනතුරු වැළැක්වීමට ප්‍රදර්ශනය කළ යුතු අවවාදාත්මක නාම පුවරු 05ක් ලියන්න.

5)

A. ඉසුරු යනු පෞද්ගලික ආයතනයක කළමනාකරුවෙක්ය. ඔහු එම ආයතනය ඉතා සාර්ථකව පවත්වාගෙන යනු ලැබේ. ආයතනයේ අරමුණු ඉටුකර ගැනීම සඳහා එම ආයතනයේ ඇති මානව හා අනෙකුත් සම්පත් කාර්යක්ෂමව හා ඵලදායක වන ලෙස ඔහු භාවිතා කරයි. ආයතනය පවත්වාගෙන යව විට ඇතිවන ගැටළු හඳුනාගෙන ඔහු එයට තනියෙන්ම කෙටි කාලයක් තුළ විසඳුම් සොයයි. ඔහු ඉතා දක්ෂ කළමනාකරු වුවත් තරඟකාරී හා අභියෝගමත් තත්වයන්ට මුහුණ දීමට බිය විය. ආයතනයේ සේවය සේවයකයන් ඔහුට මුළු සහයෝගීතාවයක් ලබා දුන්නෝය.

(i) කළමනාකරණය යනු ක්‍රියාවලියට අයත් ක්‍රියාකාරීත්වයන් ලියා දක්වන්න.
(ii) ආයතනයේ දියුණුවට බලපාන ඉසුරු හට තිබුණු ශක්තීන් 02ක් ලියන්න.
(iii) ඉසුරුගේ දුර්වලතා 02ක් හඳුනාගෙන සඳහන් කරන්න.
(iv) කළමනාකරණයේදී යොදා ගන්නා යෙදවුම් 05ක් ලියන්න.
(v) සඵලදායකත්වය (Effectiveness) යනු වචනයට අර්ථ දක්වන්න.
(vi) ඉසුරු විසින් ගන්නා ලද තීරණ වැරදි විය හැකි ප්‍රතිශතය වැඩිවීමට හේතු දක්වන්න.

B.

(i) සැපයුම් වක්‍රය දකුණට විතැන්වීම නිසා සමතුළිත මිළට හා ප්‍රමාණයට සිදුවන වෙනස්වීම ප්‍රස්තාරයකින් නිරූපණය කරන්න.
(ii) සැපයුම් කෙරෙහි බලපාන සාධක 03 ක් නම් කරන්න.
(iii) අතුරු ආදේශක හා තරඟකාරී භාණ්ඩවලට උදාහරණයක් බැඟින් ලියන්න.

C. ඉසුරු කළමනාකරණය කරන ආයතනයට අදාළ මූල්‍ය තොරතුරු පහත දක්වා ඇත.

- ආයතනයේ පරිපාලන වියදම - රු. 45,000.00
- විකුණුම් හා බෙදාහැරීමේ වියදම් - රු.3,000.00
- මූළ්‍ය වියදම් - රු.500.00
- දළලාභය - රු.100,000.00
- ලැබූ වට්ටම් - රු.3,000.00
- ආයෝජන ආදායම් - රු.10,000.00

ශුද්ධ ලාභය ගණනය කරන්න.

6) නිෂ්පාදන ස්වරූපය මත,

A.

(i) දේශීය කර්මාන්ත වර්ගීකරණය ලියා දක්වන්න.

(ii) කර්මාන්ත සඳහා උපයෝගී කර ගන්නා සම්පත් 03ක් සඳහන් කරන්න.

(iii) කර්මාන්තයක සංවර්ධන සඳහා බලපාන සාධක 02ක් කෙටියෙන් විස්තර කරන්න.

(iv) නිෂපාදන භාණ්ඩයක ගුණාත්මක බව වැඩිදියුණු කිරීම සඳහා යෝජනාවක් ඉදිරිපත් කරන්න.

B.

(i) මයික්‍රෝ මීටරයක මූලාංක වරද යනු කුමක්දැයි පැහැදිලි කරන්න.

(ii) රූප සටහන මඟින් පෙන්වා ඇති මූලාංක දෝෂයේ අගය සහ වර්ගය ලියන්න.



(iii) එම මූලාංක දෝෂය නිවැරදි කිරීමට කළ යුතු ක්‍රියාමාර්ග කුමක්ද?

(iv) මයික්‍රෝ මීටරයක දිදාල හිස මඟින් සිදුවන කාර්යය ලියා දක්වන්න.

(v) දුරස්ථ මිණුම් ගැනීම සඳහා පාරනායක භාවිතාවන අවස්ථාවක් ලෙස හැඳන්විය හැකි උපකරණයක් ප්‍රකාශ කරන්න.

(vi) අඩියක දිග ප්‍රමාණය අන්තර්ජාතික සම්මත ඒකකයට හරවා ලියන්න.

(vii) පහත සඳහන් අගයන්ට ගැළපෙන ඒකක උපසර්ග සංකේත සඳහන් කරන්න.

- A - 10^{-9}
- B - 10^{-3}
- C - 10^{6}
- D - 10^{12}

C.



(i) රූපයේ සඳහන් කර ඇති A ,B ,C යන ස්ථානවලට ආ යුතු කුමක්දැයි ලියන්න

(ii) වැඩබිමක සිදුවිය හැකි ආපදා වැළැක්වීම සඳහා පහත දැක්වෙන ශිල්පීන් සැළකිය යුතු කරුණක් බැගින් ලියන්න.

- කම්මල් පෑස්සුම්කරුවා
- වාහන කොටස් එකලස් කරන ශිල්පියා
- මිටියම් කරන ශිල්පියා

(iii) පහත දී ඇති සංකේත වලින් අදහස්වන අර්ථය සහ එම සංකේතය භාවිතා කරන ස්ථානය ලියන්න.



7)

A.

(i) වෙළඳපොළ පර්යේෂණය චක්‍රීය ක්‍රියාවලියකි. එහි ප්‍රධාන පියවර හතරම ලියා දක්වන්න.

(ii) එදිනෙදා ව්‍යාපාර කටයුතු කරගෙන යාම සඳහා කාරක ප්‍රාග්ධනයේ වැදගත්කම සඳහන් කරන්න.

(iii) ව්‍යාපාරයකට ප්‍රාග්ධන සම්පාදනය ප්‍රධාන වශයෙන් අභ්‍යන්තර මාර්ග හා බාහිර මාර්ග මඟින් සිදුකල හැකිය. එම මාර්ග දෙකට උදාහරණ 02බැගින් ලියා දක්වන්න.

(iv) ක්ෂය කිරීම යන ගිණුම්කරණ පදය අර්ථ දක්වන්න.

(v) ව්‍යාපාරයක අත්‍යාවශ්‍යයන්ම තිබිය යුතු මූලිකාංග 03ක් නම් කරන්න.

(vi) හවුල් ව්‍යාපාරයක නෛතික පුද්ගලභාවය කෙටියෙන් විස්තර කරන්න.

(vii) ව්‍යාපාර ආයතන මඟින් දායක වීමට උනන්දුවන සාමූහික සමාජීය වගකීමේ (CSR) ක්‍රියාවලියන් 02ක් සඳහන් කරන්න.

(viii) ශ්‍රී ලංකාවේ ව්‍යාපාර සිදු කිරීමට ව්‍යවසාකයන් දැනුවත් විය යුතු නීති 02ක් ලියා දක්වන්න.

(ix) නැවුම් මල් අළෙවිය සිදුකරන ව්‍යාපාරයකට, ප්‍රාථමික තරඟකරුවන් හා ද්විතීය තරඟතරුවන් උදාහරණයක් මඟින් පැහැදිලි කරන්න.

(x) ඵලදායකත්වය යනු කුමක්ද?

B. තරිඳු නමින් පවත්වාගෙන යන ව්‍යාපාරයක මූල්‍ය තොරතුරු පහත දක්වා ඇත.

- ආයතන ගොඩනැගිල්ලේ වාර්ෂික කුළිය - රු.600,000.00
- මාසික විදුලි, දුරකථකන හා ජල බිල - රු.10,000.00
- යන්ත්‍ර සූත්‍ර නඩත්තුව සඳහා මාසික වියදම - රු.15,000.00
- මාසික සේවක වේතන - රු.20,000.00
- භාණ්ඩයක් නිෂ්පාදනයට අවශ්‍ය අමුද්‍රව්‍යවල පිරිවැය - රු.1,000.00
- එක් භාණ්ඩයක් සඳහා විචල්‍ය පිරිවැය - රු.500.00
- භාණ්ඩයක විකුණුම් මිළ - රු.6,000.00

(i) ස්ථාවර පිරිවැය ගණනය කරන්න.

(ii) විචල්‍ය පිරිවැය ගණනය කරන්න.

(iii) ලාභ සමච්ඡේද ලක්ෂය ගණනය කරන්න.

8)

A.

(i) නාක්ෂණයේ භාවිතයන් හා සංස්කෘතික පරිවර්තනයන් පදනම් කර ගනිමින් වෙන් කරනු ලබන විවිධ යුගවලින් කෘෂිකාර්මික යුගයේ දැකිය හැකි සංවර්ධනය පැහැදිළි කිරීමට උදාහරණ 03ක් ලියන්න.

(ii) වාණිජකරණය යනු කුමක්දැයි හඳුන්වන්න.

(iii) ඉල්ලුම කෙරෙහි බලපාන සාධක 03ක් සඳහන් කරන්න.

(iv) නාක්ෂණයේ දියුණුව නිසා සමාජ සංස්කෘති වෙනස් වේ. යහපත් සංස්කෘතික ලක්ෂණ විනාශ වී අයහපත් අංග එක් වේ. මේ කියමනය සුදුසු උදාහරණ 02ක් ලියන්න.

(v) සංගෘහිත පරිපථය තාක්ෂණවේදයේ හැරවුම් ලක්ෂයක් ලෙස සැළකිය හැක්කේ ඇයි ?

B.

(i) උපකරණයක සංවේදීතාවය යනු කුමක්ද?

(ii) සැසඳීමේ ක්‍රමය මඟින් මිණුම් ලබාගත හැකි මිණුම් උපකරණයක් නම් කරන්න.

(iii) ක්‍රමාංකණ දෝෂයේ කොටස් 02 ලියා දක්වන්න.

(iv) පැන්සලක උස මැනීම සඳහා සූදානම් කරගත් ක්‍රියාවක් රූපයේ පෙන්වා ඇත. පාඨාංක කියවීමේදී ඇස පවත්වා ගැනීමට සුදුසු/නිවැරදි අවස්ථාව එම රූපයේ ඇඳ දක්වන්න.



(v) පරිමාණයේ ස්වරූපය අනුව මිණුම් උපකරණ වර්ග කර උදාහරණයක් බැඟින් ලියන්න.

C.

(i) යහපත් වැඩබිම පරිසරයක ලක්ෂණ 02ක් ලියන්න.

(ii) යහපත් වැඩබිම් පරිසරයක් සූදානම් කර ගැනීමේ වාසි සඳහන් කරන්න.

(iii) කණ්ඩායම් වශයෙන් වැඩ කරන වැඩබිමක අනුගමනය කල යුතු අවශ්‍ය පූර්වෝපායන් 02ක් ලියා දක්වන්න.

(iv) කපන කට්ටක් මඟින් ඇඟල්ලක් තුවාල වී ලේ ගැලීමෙන් සිටින අයෙකුට කළ යුතු ප්‍රථමාධාර ක්‍රියාවලිය 02ක් ලියන්න.

(v) ඉදිකිරීම් කටයුතු සඳහා ද්‍රව්‍ය රැගෙන යාමේ කම්කරුවෙකු පළඳින ලද යෝග්‍ය ආරක්ෂිත පැළඳුම් 02ක් සඳහන් කරන්න.

9)

A. ප්‍රතිවී යනු එළවළු අළෙවි කරන වෙළෙන්දෙකි. ඔහු කෘෂිකාර්මික දැනුම සහිත පුද්ගලයෙක් වන අතර තම නිවසෙම එළවළු වගා කරන ලදී. වස විෂ රහිත එළවළු විකුණුම් කල බැවින් ඔහුගේ වෙළඳසැළ ප්‍රසිද්ධ වී ඇත. පාරිභෝගික ඉල්ලීම මත එළවළු සුප් සහ ෆ්‍රයිඩ් රයිස් විකිණෙන ආපන ශාලාවක්ද එම වෙළඳසල තුළ ආරම්භ කිරීමට ඔහු ඉදිරිපත් විය. ආපනශාලාව මඟින් ඔහුට පෙරට වඩා ලාභයක් ඉපැයීමට හැකිවිය. එයට ටික කාලයට පසුව ප්‍රතිවීගේ වෙළඳසැල අසලම "නුවරෙලිය එළවළු" යන නමින් තව එළවළු අළෙවිසැලක් පුඛුදු විසින් ආරම්භ කරන ලදී.

(i) පාරිභෝගිකයාගේ අවශ්‍යතා හා වුවමනා තෘප්තිමත් කිරීම සඳහා ව්‍යාපාර බිහිවෙයි. අවශ්‍යතා හා වුවමනා 02 කෙටියෙන් හඳුන්වන්න.

අවශ්‍යතා : -

වුවමනා :-

(ii) ව්‍යාපාර බිහිවීමට පැවතිය යුතු තත්ත්ව 04ක් සඳහන් කරන්න.

(iii) ව්‍යාපාරයක අයිතිය අනුව ව්‍යාපාර වර්ගීකරණයේ ප්‍රීතිව් විසින් කරන ලද ව්‍යාපාරය කුමන වර්ගයට අයත් වියද?

(iv) මෙම ව්‍යාපාරය ලියාපදිංචි කිරීමේ පනත ලියා දක්වන්න.

(v) පුබුදු විසින් ආරම්භ කර වෙළඳසල මඟින් ප්‍රීතිව් හට ඇති වූ බලපෑම් 02ක් ලියන්න.

(vi) එළවළු වෙළඳසැල තුළම ආපනශාලාවක් පවත්වාගෙන යෑමෙන් ප්‍රීතීව් හට ලැබූ වාසි 02ක් ලියන්න.

(vii) තම ව්‍යාපාරය තවදුරටත් සංවර්ධනය කිරීමට ප්‍රීතිව් කළ යුතු උපක්‍රම 03ක් සඳහන් කරන්න.

B.

- වර්ෂය මුල බඩු තොගය - රු.120,000.00
- ප්‍රවාහන කුළී - රු.1,000.00
- විකුණුම් - රු.250,000.00
- 2017.12.31 දිනෙන් වර්ෂය අවසාන බඩු තොගය - රු.20,000.00

ඉහත දත්ත භාවිතා කර,

(i) ප්‍රීතිවිට අයත් එළවළු ව්‍යාපාරයේ 2017.12.31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා වෙළඳ හා ලාභාලාභ ගිණුමක් සකස් කරන්න.

(ii) එම ගිණුමෙහි දළ ලාභය සොයන්න

(iii) පහත දී ඇති වියදම් වලට උදාහරණ 02බැඟින් ලියන්න.

- ආයතන හා පරිපාලන වියදම් :-
- විකුණුම් හා බෙදාහැරීමේ වියදම් :-

(iv) ශුද්ධ ලාභය යනු කුමක්දැයි පැහැදිලි කරන්න.